# අයවැයකරණය

## වරලත් ගණකාධිකරණය - ව්‍යාපාර අදියර II

## BL6 - කළමනාකරණ ගිණුම්කරණය (MA)

## Pack 03

උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# පරිච්ඡේදය 8

# අයවැයකරණය
# (Budgeting)

## අයවැය පාලනය - අභ්‍යාස

(1) සීමිත ඒ බී සී සමාගම නිෂ්පාදන භාණ්ඩ තුන් වර්ගයක් අලෙවි කරයි. පිළිවෙලින් ඒ බී සහ සී වශයෙන් හඳුන්වන මෙම භාණ්ඩ වර්ගවල විකුණුම් වටිනාකම් මෙසේය.

| | |
|---|---|
| ඒ | රු. 350,000 |
| බී | රු. 750,000 |
| සී | රු. 700,000 |

භාණ්ඩ ඒකකය මිල නියම කිරීමේදී පහත සඳහන් ලාභ ප්‍රතිශත ඇතුලත් කර ඇත.

| | |
|---|---|
| ඒ | භාණ්ඩයේ මිල - මුළු පිරිවැයෙන් 25% ක ලාභයක් මත |
| බී | භාණ්ඩයේ මිල - විකුණුම් මිලෙන් 30% ක ලාභයක් මත |
| සී | භාණ්ඩයේ මිල - විකුණුම් මිලෙන් 20% ක ලාභයක් මත |

නිෂ්පාදන ඒකකයක පිරිවැය සංඛ්‍යානය කිරීමේදී,
1. ආයතන පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැයෙන් 50% සේ සලකා ඇත.
2. විකුණුම් පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැයෙන් 25% සේ සලකා ඇත.

ව්‍යාපාරයේ වාර්ෂික අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 240,000 කි.
ව්‍යාපාරයේ වාර්ෂික අයවැයගත සෘජු ශ්‍රම පැය ගණන 80,000 කි.

නිෂ්පාදන ඒකකයක අවශ්‍යතා

| අමු ද්‍රව්‍ය | අමු ද්‍රව්‍ය ඒකකයක මිල | ඒ | බී | සී |
|---|---|---|---|---|
| | | නිෂ්පාදන ඒකකයක් සඳහා අමුද්‍රව්‍ය ඒකක | | |
| X | රු. 0.75 | 10 | 14 | 16 |
| Y | රු. 1.00 | 12 | 16 | 06 |
| Z | රු. 1.30 | 05 | 15 | 10 |
| ශ්‍රමය පැයක වැටුප | | නිෂ්පාදන ඒකකයක් සඳහා අවශ්‍ය පැය | | |
| පළමු ශ්‍රේණිය | රු. 5 | 3 | 5 | 6 |
| දෙවැනි ශ්‍රේණිය | රු. 4 | 2 | 2 | 7 |

එක් එක් භාණ්ඩයේ විකුණුම් ඒකක ප්‍රමාණය සංඛ්‍යානය කරන්න.

(2) පහත සඳහන් විස්තර උපයෝගී කර ගනිමින් මතු දැක්වෙන අයවැය ලේඛන පිළියෙල කරන්න.

1. නිෂ්පාදන 3. මිලට ගැනීම්
2. ඍජු ද්‍රව්‍ය පිරිවැය 4. ඍජු ශ්‍රම පිරිවැය

**අතිරේක විස්තර:**

1. තොග

| සෘජු ද්‍රව්‍ය වටිනාකම රුපියල් වලින් | ජනවාරි 1 | දෙසැම්බර් 31 |
|---|---|---|
| DM 1 | රු. 30,000 | 48,000 |
| 2 | රු. 18,000 | 28,800 |
| 3 | රු. 35,000 | 56,000 |
| 4 | රු. 9,000 | 14,400 |

| නිෂ්පාදන වටිනාකම රුපියල් වලින් | ජනවාරි 1 | දෙසැම්බර් 31 |
|---|---|---|
| ඒ | රු. 105,000 | 280,000 |
| බී | රු. 196,000 | 476,000 |
| සී | රු. 378,000 | 798,000 |

2. විකිණීම් ප්‍රමිත මිල මත

| | | |
|---|---|---|
| ඒ | රු. | 800,000 |
| බී | රු. | 1,280,000 |
| සී | රු. | 2,400,000 |

3. අනෙක් විස්තර:

සෘජු ශ්‍රම පැය 1,270,000
ස්ථාවර පොදුකාර්ය පිරිවැය රු.1,143,000

ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය අනුව අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ආයතන පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැයෙන් 50% කි.

විකිණීම් පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැයෙන් 25% කි.

ලාභය විකිණීමේ මිලෙන් $12\frac{1}{2}$%

ඒකකයක ප්‍රමිත විස්තරඃ

| අමු ද්‍රව්‍ය | ඒකක මිල | ඒ ඒකක | බී ඒකක | සී ඒකක |
|---|---|---|---|---|
| 1 | 0.2 | - | 9 | 12 |
| 2 | 0.3 | 2 | 7 | - |
| 3 | 0.5 | 6 | 5 | 3 |
| 4 | 0.1 | 4 | - | 9 |
| | පැයක වැටුප් | පැය | පැය | පැය |
| අමු වැටුප් | රු. | | | |
| දෙපාර්තමේන්තුව 1 | 0.80 | 5 | 3 | 6 |
| 2 | 0.60 | 5 | 3 | 6 |

## මුදල් අයවැය ලේඛනය

(3) ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් සමහරක් මෙසේය. මෙම විස්තර අදාළ වන්නේ 2008 ජනවාරි 1 දිනටය.

| | |
|---|---|
| මුදල් | 545 |
| කෙටි කාලීන ආයෝජන | 300 |
| ණයගැතියෝ | 2,570 |
| වෙළඳ ණයහිමියෝ | 2,110 |
| වෙනත් ණයහිමියෝ | 200 |
| තොගය | 1,300 |
| ගෙවිය යුතු ලාභාංශය | 485 |
| ආදායම් බදු | 320 |

අයවැයගත ලාභාලාභ ගිණුම

| | **ජනවාරි** | **පෙබරවාරි** | **මාර්තු** |
|---|---|---|---|
| විකිණීම් | 2,100 | 1,800 | 1,700 |
| විකිණීමේ පිරිවැය | 1,655 | 1,405 | 1,330 |
| දළ ලාභය | 445 | 395 | 370 |
| ආයතන, විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | 315 | 270 | 255 |
| බද්දට පෙර ලාභය | 130 | 125 | 115 |

එක් එක් මාසය අවසානයේ අයවැයගත ශේෂ මෙසේය.

| | ජනවාරි 31 | පෙබරවාරි 28 | මාර්තු 31 |
|---|---|---|---|
| කෙටි කාලීන ආයෝජන | 700 | - | 200 |
| ණයගැතියෝ | 2,600 | 1,500 | 2,350 |
| තොගය | 1,200 | 1,100 | 1,000 |
| වෙළඳ ණයහිමියෝ | 2,000 | 1,550 | 1,500 |
| වෙනත් ණයහිමියෝ | 200 | 200 | 200 |
| ගෙවිය යුතු ලාභාංශ | 485 | - | - |
| ආදායම් බදු | 220 | 120 | 20 |

ඉහත සියළුම සංඛ්‍යා රුපියල් 000 කි.

මාසික ක්ෂය ප්‍රමාණය රු. 60,000 කි. මෙය ආයතන වියදම් වලට ඇතුලත් කර ඇත. පෙබරවාරි මාසයේදී රු. 800,000 කට ස්ථාවර වත්කම් මිලදී ගත යුතුය. පාවිච්චි කළ යන්ත්‍රයක් මාර්තු මාසයේ දී විකිණීමට අදහස් කර ඇති අතර, එහි සුන්බුන් වටිනාකම රු. 50,000.

පහත සඳහන් දෑ ඔබගෙන් බලාපොරොත්තු වේ.

1. මාසික සහ මුළු කාර්තුව සඳහා මුදල් අයවැය ලේඛනය

(4) ජනවාරි මස 01 වෙනි දින රු. 400,000 ක් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට X මහතා අදහස් කරයි. එදිනම ඔහු මතු සඳහන් ස්ථාවර වත්කම් මිලදී ගනු ඇත.

| | |
|---|---|
| කර්මාන්තශාලාව | රු. 200,000 |
| යන්ත්‍ර සූත්‍ර | රු. 120,000 |

ව්‍යාපාරයේ ඇස්තමේන්තු කළ ආදායම් සහ වියදම් මෙසේය.

1 පිරිවැය: ඒකකයක ද්‍රව්‍ය පිරිවැය රු. 20 ක් වන අතර ශ්‍රම පිරිවැය රු. 10 කි. මාසයක ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය වියදම රු. 10,000 ක් වන අතර එයින් රු. 2,000 ක් ක්ෂය වෙන් කිරීම් වේ.
පෙබරවාරි මාසයේ සිට ප්‍රචාරන කටයුතු ආරම්භ කෙරෙන අතර, එම මාසයේ ප්‍රචාරණ වියදම රු. 8,000 කි. ඊටපසු මාසයක ප්‍රචාරන වියදම රු. 3,000 කි. මාසික විකුණුම් වියදම් රු. 50,000 කි.

මාසයක වේතන වලින් $\frac{3}{4}$ ක් එම මාසයේදී ද ඉතිරිය ඊළඟ මාසයේදී ද ගෙවනු ඇත.

2. විකුණුම්

| | |
|---|---|
| ජනවාරි ඒකක | 1,000 |
| පෙබරවාරි ඒකක | 2,000 |
| මාර්තු සිට මාසයකට ඒකක | 4,000 බැගින් |

ඒකකයක විකුණුම් මිල රු. 50 කි. විකුණුම් වලින් 10% අත්පිට විකුණුම් වන අතර, ඒ සඳහා 10% ක වෙළඳ වට්ටමක් දෙනු ඇත.

3. තොග
   a. අමු ද්‍රව්‍ය: ව්‍යාපාරය ආරම්භයේදී රු. 60,000 ක තොග මිලදී ගනු ඇත. රු. 10,000 ක තොග මට්ටමක් ආරම්භක මාසයේ සිට පවත්වා ගත යුතු අතර මාසික විකුණුම් සඳහා අවශ්‍ය තොග විකුණුම් කරන මාසයේදීම මිලදී ගනු ඇත.
   b. නිමි භාණ්ඩ: පළමු මාසයේ සිට ඒකක 500 තොග මට්ටමක් පවත්වා ගනු ලබන අතර හතරවන මාසයේදී මෙම මට්ටම ඒකක 750 ක් දක්වා වැඩි කරනු ඇත.
   c. නොනිමි භාණ්ඩ: කිසිදු මාසයක් අවසානයේදී නොනිමි භාණ්ඩ තොගයක් ඇති නොවේ.

4. මිලදී ගැණුම් / විකුණුම් කොන්දේසි
   a. ආරම්භක අමු ද්‍රව්‍ය සඳහා මිලදී ගත් විගසම මුදල් ගෙවිය යුතුයි. ඉන්පසු මිලදී ගැනීම් සඳහා මුදල් ගෙවිය යුත්තේ මිලදී ගත් මාසයට පසුව මාසයේදීය. ඒ සඳහා මුදල් ගෙවීමේදී 10% ක මුදල් මට්ටමක් ලැබෙනු ඇත.
   b. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
      20% ක් විකිණීම් කළ මාසයේදී
      50% ක් ඊළඟ මාසයේදී
      22.5% ක් ඊළඟ මාසයේදී
      5% ක් ඊළඟ මාසයේදී

   විකිණීම් කළ මාසයේදී ලැබෙන මුදල් සඳහා 5% ක වට්ටමක් දිය යුතු වේ.

5. යම් අතිරේක මුදල් අවශ්‍යතාවයක් වේ නම් 10% යේ වාර්ෂික පොලියට ණය මුදලක් මිතුරකුගෙන් ලබාගත හැක. එකම වතාවකදී ලබාගත හැකි මෙම ණය මුදල ඊළඟ රු. 10,000 ක් දක්වා ලබාගත හැකි වේ. හැකි ඉක්මණින් එක්වරකදී මෙම මුදල ගෙවිය යුතුය.

6. ආපසු ගැනීම්
   පෙබරවාරි මාසයේ සිට මාසික ආපසු ගැනිලි රු. 3,000 කි.

   පහත සඳහන් දෑ සකස් කරන්න.
   1. ජුනි 30 න් අවසන් වන මුල් මාස 6 සඳහා පුරෝකථනය කළ මුදල් අයවැය ලේඛනයක්
   2. ජුනි 30 න් අවසන් වන මුල් මාස 6 සඳහා පුරෝකථනය කළ ලාභාලාභ ගිණුමක්
   3. ජුනි 30 දිනට පුරෝකථන කළ ශේෂ පත්‍රයක්